# HDFC BANK

දශක හතරක කාලයක් පුරා විවිධ මූල්‍ය විසඳුම් හරහා සුවහසක් ශ්‍රී ලාංකිකයින්ගේ හිසට සෙවණක් මෙන්ම ව්‍යාපාරික ප්‍රජාවට මූල්‍ය සහාය සපයමින් දැයේ අභිවෘද්ධිය උදෙසා කැප වන බැංකුවක් සමඟ ඔබේ බැංකුකරණ වෘත්තිය උසස් තලයකට ගෙන ඒමට මහඟු අවස්ථාවක් උදා වී ඇත.

**HDFC** බැංකුවෙහි පහත සඳහන් තනතුර සඳහා දක්ෂ, ක්‍රියාශීලී සහ සුබවාදී දැක්මක් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරණ අභ්‍යාසලාභී

**යෝග්‍යතා නිර්ණායක:**

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් පහත සඳහන් කර ඇති විෂය / අංශවලට අවම වශයෙන් දෙවැනි පංතියේ ඉහළ පෙළ සාමාර්ථයයක් හෝ 4.0ක් වන උපරිමයකින් අවම වශයෙන් 3.5 ක ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) සහිත උපාධියක් ලබා තිබීම.

  ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය, ගණිතය, ගිණුම්කරණය, බැංකුකරණය, මූල්‍ය, වාණිජ්‍යය, ව්‍යාපාර පරිපාලනය, කළමනාකරණය (රාජ්‍ය / මූල්‍ය / ගිණුම්කරණ / ව්‍යාපාර), අලෙවිකරණය, මානව සම්පත් කළමනාකරණය, ඉංජිනේරු විද්‍යාව, පරිගණක විද්‍යාව, භෞතික විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, නීතිය, අන්තර්ජාතික ව්‍යාපාරකරණය, තක්සේරුකරණය, කෘෂිකර්මය හෝ වෙනත් බැංකුකරණ සහ මූල්‍ය අංශයන්ට අදාළ වෙනත් යම් ක්ෂේත්‍රයක්.

  හෝ

- ඉහත සඳහන් කර ඇති විෂය / අංශවලට අදාළව ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් ලැබූ උපාධියක් සමඟ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) හෝ එක්සත් රාජධානියේ වරලත් බැංකුකරුවන්ගේ ආයතනයේ (CIB) - UK අවසන් අදියර සමත් වී තිබීම.

  හෝ

- පහත සඳහන් කර ඇති ආයතනවලින් සම්පූර්ණ සුදුසුකම් සපුරා තිබීම. (අවසන් සාමාර්ථය)

  - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICA - SL)
  - එක්සත් රාජධානියේ කළමණාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනය (CIMA - UK)
  - එක්සත් රාජධානියේ වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය (ACCA - UK)
  - ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (CMA - SL)
  - එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනය (CIM - UK)
  - CFA ආයතනයේ වරලත් මූල්‍ය විශ්ලේෂක පාඨමාලාව (CFA - USA)
  - එංගලන්තයේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරී ආයතනය (ICA - EW)

  හෝ

- නීතිඥ

**වයස් සීමාව:** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30ට අඩු විය යුතුය.

**තනතුර සඳහා අදාළ වන නියමයන් සහ කොන්දේසි:**

- තනතුරට අදාළ පුහුණු කාලය වසර දෙකක් වන අතර, පුහුණු කාලය තුළ මසකට රු. 75,000ක දීමනාවක් ගෙවනු ලැබේ.
- තෝරා ගන්නා අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පිහිටි ශාඛාවක සේවය කිරීමට සූදානම් විය යුතු අතර, බඳවා ගැනීමෙන් අනතුරුව මුලින්ම අනුයුක්ත කරන දිස්ත්‍රික්කය / ප්‍රදේශය තුළ පුහුණු කාලය ද ඇතුළත් වන සේ අවම වශයෙන් වසර පහක කාලයක් සේවය කිරීම අනිවාර්ය වේ.
- පුහුණු කාල සීමාව තුළ සතුටුදායක කාර්ය සාධනය සපුරාලීම මත III (3) ශ්‍රේණියේ විධායක නිලධාරී නිත්‍ය තනතුරෙහි පිහිටුවීම සඳහා සළකා බලනු ලැබේ.

**බඳවා ගැනීම සඳහා අදාළ නියමයන් සහ කොන්දේසි:**

අදාළ අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට අයත් www.doenets.lk යන වෙබ් අඩවියේ පළ කෙරෙන අතර, 2024 ජූලි 22 දින පෙ.ව 09:00 සිට 2024 අගෝස්තු 12 දින ප.ව 09:00 දක්වා අදාළ අයදුම්පත් යොමු කළ හැකිය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය:**

අපේක්ෂකයින් ලිඛිත තරග විභාගයේදී ලැබූ ප්‍රතිඵල සහ සම්මුඛ පරීක්ෂණයේදී ලැබූ ලකුණු සංඛ්‍යාව පදනම් කර ගෙන සකස් කරනු ලබන ලැයිස්තුවේ අනුපිළිවෙළ අනුව ප්‍රකාශයට පත් කර ඇති ඇබෑර්තු සංඛ්‍යාව සම්පූර්ණ කිරීම සඳහා වන බඳවා ගැනීම් සිදු කෙරෙනු ඇත. කෙසේ වෙතත්, සම්පූර්ණ කිරීමට නියමිත ඇබෑර්තු සංඛ්‍යාව සහ බඳවා ගැනීමට අදාළ දින පිළිබඳ තීරණය කිරීම HDFC බැංකුවේ අභිමතය පරිදි සිදු වේ.

**ලිඛිත විභාගය:**

විභාග කොමසාරිස් ජනරාල්වරයා මෙම ඇබෑර්තු සඳහා වන බඳවා ගැනීම්වලට අදාළ ලිඛිත විභාගය පවත්වනු ඇත. මෙය 2024 ඔක්තෝම්බර් මස පැවැත්වීමට අපේක්ෂා කෙරේ. මෙම විභාගය කොළඹදී හෝ පහත නම් සඳහන් කර ඇති නගරවල ස්ථාපනය කරනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පැවැත්වෙනු ඇත. කිසිදු අවස්ථාවක සිය අභිමතය පරිදි නගරය / නගර වෙනස් කිරීමට අයදුම්කරුවන්ට අවසර නොලැබේ. යම් කිසි විභාග මධ්‍යස්ථානයක විභාගය පැවැත්වීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැති අවස්ථාවක අදාළ මධ්‍යස්ථානය තෝරා ගත් අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන තෝරා ගැනීම අනුව වෙනත් සුදුසු විභාග මධ්‍යස්ථානයක් හෝ වෙනත් ආසන්න නගරයක ස්ථාපනය කරන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට කටයුතු යොදනු ඇත.

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් කේතය | දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් කේතය |
|---|---|---|---|
| කොළඹ | 01 | බදුල්ල | 08 |
| මහනුවර | 02 | රත්නපුර | 09 |
| ගාල්ල | 03 | නුවරඑළිය | 10 |
| යාපනය | 04 | මාතලේ | 11 |
| ත්‍රිකුණාමලය | 05 | මඩකලපුව | 12 |
| කුරුණෑගල | 06 | | |
| අනුරාධපුර | 07 | | |

**විභාගය සඳහා ඇතුළත් වන විෂයන්**

| විෂය අංකය | විෂය | මාධ්‍යය | කාල සීමාව | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| **01** | ඉංග්‍රීසි භාෂාව | ඉංග්‍රීසි | පැය 1 1/2 | **100** | **40** |
| **02** | විශ්ලේෂණ කුසලතා / බුද්ධි පරීක්ෂණය | සිංහල / ඉංග්‍රීසි / දෙමළ | පැය 1 | **100** | **40** |
| **03** | සාමාන්‍ය දැනීම | සිංහල / ඉංග්‍රීසි / දෙමළ | පැය 1 | **100** | **40** |

**සටහන**

ලිඛිත විභාගය පැවැත්වීම තුළින් මෙම තනතුරට අදාළ රාජකාරි සිදු කිරීම සඳහා අපේක්ෂකයා සතු හැකියාව සහ කුසලතා පරික්ෂා කිරීමට අපේක්ෂා කෙරේ. ලිඛිත විෂය සමත් වීමට නම් අදාළ අපේක්ෂකයා ඒ ඒ විෂය සඳහා වෙන් කර ඇති ලකුණු සංඛ්‍යාවෙන් අවම වශයෙන් 40%ක් ලැබිය යුතු වේ.

**සම්මුඛ පරීක්ෂණය**

අයදුම් කර ඇති අපේක්ෂකයින් මෙම තනතුරට අදාළ පුවත්පත් දැන්වීමේ සඳහන් කර ඇති අවම සුදුසුකම් සපුරා තිබේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා සහ තනතුර දැරීම සඳහා සුදුසු ද යන්න තව දුරටත් පරික්ෂා කර බැලීම සඳහා මෙම සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙනු ඇත. යම් කිසි අපේක්ෂකයකු ලිඛිත තරග විභාගය සමත් වුවත්, පුවත්පත් දැන්වීමේ සඳහන් කර ඇති පරිදි අවම සුදුසුකම් සපුරා නැති අවස්ථාවක ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා පත් වීමට සුදුසුකම් නොලබන බව විශේෂයෙන් අවධාරණය කෙරේ. සම්මුඛ පරීක්ෂණයේදී ලැබිය හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 100ක් වන අතර, එහිදී අපේක්ෂකයාගේ පෞරුෂත්වය සහ අනෙකුත් ගුණාංග පිළිබඳව සළකා බලනු ඇත. HDFC බැංකුවේ අභිමතය පරිදි තරග විභාගයෙන් ඉහළම ලකුණු ලැබූ අයදුම්කරුවන් අතරින් දැනට පවතින ඇබෑර්තු සංඛ්‍යාවෙන් තුන් ගුණයකට සමාන සංඛ්‍යාවක් ඇතුළත් වීමේ අංක පිළිවෙළට සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත.

**විභාගය සඳහා අදාළ කොන්දේසි**

I. බඳවා ගැනීම්වලට අදාළ ලිඛිත විභාගයේ පළමු විෂය (ඉංග්‍රීසි භාෂාව) ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පැවැත්වෙන අතර, දෙවැනි (විශ්ලේෂණ කුසලතා / බුද්ධි පරීක්ෂණය) සහ තෙවැනි (සාමාන්‍ය දැනීම) විෂය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම පැවැත්වෙනු ඇත. දෙවැනි සහ තෙවැනි විෂය සඳහා ඔවුන්ගේ අභිමතය පරිදි එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටීමට අයදුම්කරුවන්ට අවස්ථාව ලැබේ. අපේක්ෂකයින්ට සිය අයදුම් පත්‍රයේ සඳහන් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර නොලැබේ. සියලු අපේක්ෂකයින් විෂයන් තුනටම අදාළ ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටීම අනිවාර්ය වේ.

II. විභාගය සඳහා වන මාර්ගගත අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු වේ. මාර්ගගත ක්‍රමය ඔස්සේ යොමු කරනු ලබන විභාග අයදුම්පත් ලැබුණු පසු අපේක්ෂකයින් සපයා ඇති ජංගම දුරකථන අංකය වෙත එවනු ලබන කෙටි පණිවුඩයක් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් අදාළ අයදුම්පත භාර ගත් බවට වන දැනුම් දීමක් විභාග දෙපාර්තමේන්තුව සිදු කරනු ඇත.

III. විභාග ගාස්තුව රුපියල් 1,200ක් වේ. මාර්ගගත අයදුම් කිරීමේ පද්ධතිය යටතේ සපයා ඇති පහත සඳහන් ගෙවීම් ක්‍රම ඔස්සේ පමණක් අදාළ ගෙවීම සිදු කළ යුතු වේ.

1. ඕනෑම බැංකු ක්‍රෙඩිට් කාඩ් පතක්
2. ඕනෑම බැංකු ඩෙබිට් කාඩ් පතක්
3. ලංකා බැංකුවේ මාර්ගගත බැංකුකරණ ක්‍රමය
4. ලංකා බැංකුවේ ගෙවීම් පත්‍රිකාව

**සටහන**

ඉහත සඳහන් කර ඇති ක්‍රමවේද ඔස්සේ ගෙවීම් සිදු කිරීමට අදාළ උපදෙස් වෙබ් අඩවියේ විභාගය සඳහා අදාළ වන කොටසේ තාක්ෂණික උපදෙස් වශයෙන් පළ කර ඇත.

IV. ගෙවීම ලැබුණු බව කෙටි පණිවුඩයක් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් හරහා අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ඇත. ඉහත කී විභාග ගාස්තුව සම්පූර්ණයෙන් ගෙවිය යුතු අතර, අදාළ ගාස්තුවට අඩු හෝ වැඩි ගෙවීම් සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. ඉහත සඳහන් කර ඇති ගෙවීම් ක්‍රම හරහා ගෙවීම් සිදු කරන අතරතුර මතු විය හැකි කිසිදු දෝෂයක් සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

V. ගෙවන ලද විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත නැවත ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු නොකෙරේ.

VI. විභාගයට පෙනී සිටීම සඳහා වන ප්‍රවේශ පත්‍රය විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අතර, අයදුම්කරු ඒ මත පැහැදිලිව පෙනෙන සේ අත්සන් කර එය සහතික කරවා ගත යුතුය. අයදුම්කරුවන් රජයේ පාසලක විදුහල්පතිවරයකු, විශ්‍රාමික නිලධාරියකු, ප්‍රදේශය භාර ග්‍රාම නිලධාරිවරයා, සාම විනිසුරුවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ සේවය කරන බලයලත් නිලධාරියකු, රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයට අනුබද්ධව ස්ථිර සේවයේ යෙදෙන නිලධාරියකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති ස්වාමීන් වහන්සේ නමක් හෝ සැලකිය යුතු තනතුරක් දරන වෙනත් ඕනෑම ආගමක පූජකවරයකු ලවා අදාළ ප්‍රවේශ පත්‍රය මත තබා ඇති සිය අත්සන සහතික කරවා ගත යුතු වේ.

**සටහන**

කිසිදු අයදුම්කරුවෙකුට අදාළ ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීම සඳහා අවස්ථාව නොලැබෙනු ඇත. සෑම අයදුම්කරුවකුම ඔහුගේ / ඇයගේ අත්සන තබා සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේදී විභාග ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

VII. පුවත්පත් දැන්වීමේ සඳහන් කර ඇති අවම සුදුසුකම් සපුරා නොමැති තැනැත්තන් අයදුම්පත් යොමු නොකළ යුතුය. එක් අයදුම්කරුවකු අයදුම්පත් එකකට වැඩි සංඛ්‍යාවක් යොමු කිරීමෙන් වැළකිය යුතුය. අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීම සඳහා වන ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම තුළින් ඔහු / ඇය විභාගයට පෙනී සිටීමට හෝ ඉහත කී තනතුර දැරීමට සුදුසුකම් නොලබනු ඇත.

VIII. මෙම තනතුරට අදාළ පුවත්පත් දැන්වීමේ සඳහන් කර ඇති අවම සුදුසුකම් සපුරා ඇති සහ අදාළ වයස් සීමාවට අයත් තැනැත්තන් පමණක් විභාගය සඳහා අයදුම් කර ඇතැයි යන උපකල්පනය මත පදනම්ව අයදුම්පත් භාර ගන්නා අවසන් දින හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්වරයා අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම පුවත්පත් දැන්වීම් හරහා සහ විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය හරහා ඒ බව දැනුම් දීමට කටයුතු යොදනු ලැබේ. එම දැනුම් දීමෙන් දින දෙකක් හෝ තුනක් ගත වූ පසුත්, විභාග ප්‍රවේශ පත්‍රයක් නොලැබුණොත් දැන්වීමේ සඳහන් කර ඇති ආකාරයට විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවට ඒ පිළිබඳව දැනුම් දීමට අයදුම්කරුවන් පියවර ගත යුතු වේ. එවැනි දැනුම් දීමක් සිදු කිරීමේදී විභාගයේ නම අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය පැහැදිලිව සහ නිවැරැදිව සඳහන් කිරීමට අදාළ අයදුම්කරු වග බලා ගත යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් ඉහත සඳහන් කළ තොරතුරු සහ ප්‍රවේශ පත්‍රය යොමු කළ හැකි ෆැක්ස් අංකයක් පැහැදිලිව සහ නිවැරැදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් එවීම වඩාත් කාර්යක්ෂම වනු ඇත. විභාග දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගැනීමේදී පහත සඳහන් දෑ ළඟ තබා ගැනීම දෙපාර්තමේන්තුව ඉල්ලා සිටින තොරතුරු කඩිනමින් සැපයීමට උපකාර වනු ඇත. උදා: අයදුම්පතේ ඡායා පිටපත සහ විභාග ගාස්තුව ගෙවීමෙන් පසු ඔබ සන්තකයේ තබා ගත් ලදුපත.

IX. සම්පූර්ණ කළ යුතු ඇබෑර්තු ප්‍රමාණය තීරණය කිරීම, විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට තීරණය කිරීම හෝ මෙම දැන්වීමේ සඳහන් කර නොමැති වෙනත් කරුණක් සම්බන්ධයෙන් වන තීරණ ගැනීමට HDFC බැංකුවට බලය සහ හිමිකම් පැවරේ.

X. මෙම තනතුර සඳහා වන බඳවා ගැනීම්වලට අදාළ විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සෑම අයදුම්කරුවකුම බැඳී සිටී. අදාළ නීති සහ රෙගුලාසි උල්ලංඝනය කරනු ලබන යම් අයදුම්කරුවකු වේ නම්, ඔහු / ඇය විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වනු ඇත.

XI. අයදුම්කරුවන් ඔහු / ඇය පෙනී සිටින සෑම විෂයකටම අදාළව විභාග ශාලාවේදී සිය අනන්‍යතාව තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ඕනෑම ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින්ට හැකියාව ඇත.

(අ) ජාතික හැඳුනුම්පත
(ඇ) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(ඈ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

අයදුම්කරුවන් මුහුණු සහ කන් ආවරණය කිරීමෙන් තොරව සිය අනන්‍යතාව හඳුනා ගත හැකි වන ආකාරයෙන් විභාග ශාලාවට ඇතුල් විය යුතුය. සිය අනන්‍යතාව තහවුරු කිරීම ප්‍රතික්ෂේප කරන යම් අයදුම්කරුවකු වේ නම්, ඔවුන්ට විභාග ශාලාවට ඇතුළු වීමට අවසර නොලැබෙනු ඇත. සෑම අයදුම්කරුවකුම විභාග ශාලාවෙන් පිටව යන මොහොත දක්වා විභාග සුපරීක්ෂකවරුන්ට පැහැදිලිව හඳුනා ගත හැකි වන සේ මුහුණු සහ කන් ආවරණය කිරීමෙන් තොරව රැඳී සිටිය යුතුය.

XII. ප්‍රතිඵල නිකුත් කිරීම

අදාළ ලිඛිත විභාගයේදී සහ සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලැබූ ලකුණු අනුපිළිවෙළට, විභාග අංකය පදනම් කර ගෙන සකස් කළ ප්‍රතිඵල ලේඛනය සහ පවතින ඇබෑර්තු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන්ගේ නම් විභාග කොමසාරිස් ජනරාල් විසින් HDFC බැංකුව වෙත යොමු කරනු ලබනු ඇත.

විභාග කොමසාරිස් ජනරාල් විභාගය සඳහා පෙනී සිටි සෑම අයදුම්කරුවකුගේම ප්‍රතිඵල පෞද්ගලිකව හෝ www.results.exams.gov.lk යන වෙබ් අඩවියේ පළ කිරීම මඟින් දැනුම් දෙනු ඇත.

XIII. මෙම දැන්වීමේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පිටපත්වල යම් කිසි නොගැළපීමක් උද්ගත වන අවස්ථාවක සිංහල පිටපත ප්‍රමුඛ කර සැලකිය යුතු වේ.

සහකාර සාමාන්‍යාධිකාරි - මානව සම්පත් හා පාලන
**HDFC** බැංකුව
තැ. පෙ. 2085
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත
කොළඹ 02
දුරකථන අංකය: 0112356800
වෙබ් අඩවිය: **www.hdfc.lk**